පිරිනිවුන ඒ රහත් මුනිවරු - 2

නිධානයක් ලද දුගියා

අරුණෝදයෙන් දවසට ආරම්භයක් ලබා දෙනවා සමඟම, කසාවත පොරවාගෙන, පාත්‍ර අතට ගත්ත භික්ෂූන් වහන්සේලාගෙන්, මං මාවත් පිරී ඉතිරී යනවා. අරුණෝදයෙ නැගෙන හිරුටත් වඩා දීප්තියක් ඇති තථාගත බුදුරජාණන් වහන්සේ, පිරිස ඉදිරියෙන් වඩිනවා දක්නට ලැබුනා. මේ දසුන නරඹන්නට, දන් පූජා කරන්නට, වන්දනා මාන කරන්නට, ඒ කාලයේ පිරිස බොහෝ සැදී පැහැදී හිටියා.

සුපුරුදු පරිදි එක්තරා දිනක , මේ විදියටම දවස ගෙවීගෙන යනකොට, ඉතා අහඹු සිදුවීමක් සිදු වුනා . පිණ්ඩපාතයේ වඩින විට ධර්මයක් දේශනා නොකරන බුදුරජාණන් වහන්සේ, එක්තරා විකාර වස්ත්‍රයක් ඇඳ ගත්ත තපසෙක්ට යමක් දේශනා කරනු දක්නට ලැබුනා. ඉන්පසුව තථාගතයන් වහන්සේ නැවතත් පිඬු සිඟා වැඩි අතර, ඒ තවුසා එතනම හිඳ, දෑස් පියාගෙන භාවනාවට යොමු වුනා. සුළු මොහොතක් මේ තවුසා භාවනාවේහි නිරත වෙමින් සිටින කාලයේදී, කොහෙන්දෝ පැනගෙන දුවාගෙන ආපු, කුලප්පු වූ ගවයෙකු වෙතින් පහර කෑමකට ලක් වෙලා, ඇදගෙන වැටුනා.

මේ සිද්ධිය ඇසින් දුටු අයෙක් වහාම මේ විකාර රූපයක් ඇඳ ගත්ත තවුසා ළඟට ගිහිල්ලා,

"ඔබට කෙසේද? වහාම ප්‍රතිකාර ලබා ගන්නට යමුයි නේදැ" යි යෝජනා කර සිටියා.

ගවයා පහර දීමෙන් ඉතා බරපතල ලෙස තුවාල ලබා සිටි මේ තවුසා, අතින් , ඒ බව නොකරන ලෙස සංඥා කර සිටියා. ඒත් සමඟම සිනාමුසු වූ ප්‍රීතිමත් මුහුණින් , ඔහු මෙසේ පැවසුව.

"මම බාරුකච්ච ගමේ. මගේ නම බාහිය. මගේ වෘත්තිය වුනේ මුහුදු යන එක. අපි කාලයක් තිස්සෙ මුහුදු ගියා . එක දවසක් අපේ නැව ගිලුන. නැවේ හිටපු අනෙක් ඔක්කෝම අය වගේ අතුරුදහන් වුනා. මම සුප්පාරක පටුන පැත්තට පීනගෙන පීනගෙන ගිහිල්ල ජීවිතේ බේරගත්තා.

වෙරළට ලඟා වෙනකොට මට හොඳටෝම මහන්සියි. බඩගිනියි. ඇගේ එක වස්ත්‍රයක්වත් තිබ්බෙ නෑ. පස්සෙ ගස්වල අතුකොළ, පොතු එකතු කරල, වැල්පටකින් ගැට ගහලා, වස්ත්‍රයක් වගේ ඇඳ ගත්ත. දින ගණනාවක් ආහාර ගත්තෙ නැතුව හිටපු මට අධික කුසගින්නක් දැනුන වගේම, මගේ

හැඩයත් බොහෝම කෘෂ වෙලයි තිබුනෙ. ඊට පස්සෙ ඒ වෙරළට තිබුනු මංමාවතක් ඔස්සේ ඇවිදගෙන යනකොට මට එක්තරා ගමක් හම්බ වුනා .

ඒ ගමේ හරි අපූරු මිනිසුන් කොට්ඨාසයක් හිටියා. මාව දැකපු ගමන්ම ඒගොල්ලො මට වන්දනා කරන්න ගත්ත. ආහාර වලින් සංග්‍රහ කරන්න ගත්ත. ඉන්න තැනක් දුන්න. පුද සත්කාර කරන්න ගත්ත. මට 'රහතන් වහන්සේ'ය කියල ආමන්ත්‍රණය කරන්න ගත්ත. ඔය විදියට මම අවුරුදු ගණනාවක්ම ජීවත් වුනා. මමත් හිතාගෙන හිටියෙ ගස්වල පොතුවලින්, කොළ කෑලි වලින්, ලී කෝටුවලින් වස්ත්‍රයක් හදාගෙන, ඒක ඇඳගෙන ඉන්න එක තමයි රහත්කම කියල.

අවුරුදු ගණනාවකට පස්සේ මේ පහුගිය දවසක, මං දැකපු එක්තරා හීනෙක කවුරු හරි කෙනෙක් මට කතා කලා . එයා කතා කරල හයියෙන් හිනා වුනා. හිනාවෙලා කිවුවා,

"ඔයා රහත් වෙලත් නෑ. රහත් වෙන මාර්ගය ගැන දන්නෙත් නෑ. ඒ මාර්ගය පුරුදු කරන්නෙත් නෑ. ඒ මාර්ගය පුරුදු කරන්න අහලවත් නෑ" කියල.

මෙහෙම හීනෙන්ම කිවුවහම, මමත් හීනෙදි කතා කරල ඒ හීනෙන්ම ඇහුවා, "එහෙනම් මං කොහොමද රහත් වෙන්නෙ?" කියල. අන්න එතකොට ඒ හීනෙන්ම මට සැවැත්නුවර ගැන කිවුව.

ඒක ඇහිච්ච ගමන්ම, නිධානයක් මුණ ගැහිච්ච දුගියෙක් ඒ නිධානය හොයාගෙන යනව වගේ, මම සැවැත්නුවර පැත්තට දුවන්න පටන් ගත්ත. දින ගණනාවකින් පස්සේ මේ රම්‍ය වනයට එනකොට, බුදුරජාණන් වහන්සේ කියන කෙනා එහෙ වැඩ හිටියෙ නැහැ. එහෙ හිටපු කට්ටියගෙන් මම ඇහුව, "කෝ බුදුරජාණන් වහන්සේ?" කියල. ඒගොල්ලො කිවුව බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වීදියේ පිඬු සිඟා වඩිනවයි කියල.

සූර්යයාගේ වගේ දීප්තිමත් මුහුණක් තිබ්බිච්ච , නිසසල අත් තිබ්බිච්ච , ශාන්ත දාන්නතව හැසිරිච්ච, අමා ධර්මය බෙදන්නෙකු වගේ පාත්‍රයක් අතින් ගත්ත, බුදුරජාණන් වහන්සේව මම හිතින් මවාගෙනයි හිටියේ. හැබැයි මට මේ හරියෙදි උන් වහන්සේව හම්බ වුනා. මම උන් වහන්සේට වන්දනා කරල ඉල්ලා සිටියා,

"උවදුරු සහිත මාර්ගයේ මුලා වෙලා ඉන්න මට, නිවැරදි ධර්මය දේශනා කරන සේක්වා !" කියල.

බුදුරජාණන් වහන්සේ මාව දන්නවා. උන් වහන්සේ මගේ නමින් මට කතා කලා. මට කිවුවා,

"බාහිය මේ පිණ්ඩපාතෙ වඩින වෙලාව. බණ කියන වෙලාව නෙවෙයි" කියල.

මං නැවත නැවතත් පෙරත්ත කර සිටිය.

"බුදුරජාණන් වහන්ස, මගේ ජීවිතේ ඉවරයක් වෙන්න පුළුවන්. ඊට කලින් හරි මට මේ ධර්මය පොඩ්ඩක් කියල දෙන්න" කියල.

මං එහෙම කිවුවහම බුදුරජාණන් වහන්සේ මං දිහාවට හැරිල, ඒ ධර්මය මට කියල දුන්න.

ලෝකයෙ ඉන්න අපි ඇහැට රූප දැකල, ඒ රූප වලට කැමති අකමැතිකම් හදාගෙන, ඒව ඔස්සේ සිතුවිලි මෙහෙයවූවා වුනාට, බුදුරජාණන් වහන්සේ මට කියල දුන්නා, 'දැක්කොත් දැක්කා පමණයි' කියන තැනින් නවතින්න කියල.

ලෝකයා කනට ශබ්දයක් අහලා, කැමති අකමැතිකම් හදා ගත්තා වුනාට, ඒ ඔස්සේ තමන්ගෙ සිතුවිලි මෙහෙයවූවා වුනාට, බුදුරජාණන් වහන්සේ මට කියල දුන්නා, 'ඇසුනොත් ඇසුනා පමණයි' කියන තැනින් නතර වෙන්න කියල.

ලෝක සත්ත්වයා ශරීරයට ස්පර්ශය දැනගෙන, කැමති දේට ආලය කරන අතර, අකමැති දේට ගැටෙන එක සාමාන්‍ය ස්වාභාවයක්. එහෙම කරගෙන උවමනා එපාකම් නිර්මාණය කර ගන්නව. නමුත් බුදුරජාණන් වහන්සේ මට කියල දුන්න 'දැනුනොත් දැනුනා විතරයි' කියල. එතනින් නවතින්න කියල කිවුව .

ලෝක සත්ත්වයා හිතට අරමුණක් ආපුහම, ඒ අරමුණ ඔස්සේ කැමති අකමැති විදියට කල්පනා කරන්න පටන් ගන්නව. ඒ අරමුණ ක්‍රියාත්මක කරන්න යනව. ඒ වුනාට බුදුරජාණන් වහන්සේ මට කියල දුන්න බාහිය, 'දැනගත්තොත් දැනගත්තා විතරයි' කියන තැනින් නතර වෙන්න කියල.

මෙහෙම දේශනා කරපු බුදුරජාණන් වහන්සේ මට තවත් කිවුවා,

"බාහිය, ඔබ ඔය විදියට ජීවත් වෙනවා නම්, ඔබ අතීතයෙ ඉන්නෙත් නැහැ. අනාගතයට යන්නෙත් නැහැ. වර්තමානය තුල ගිලෙන්නෙත් නැහැ. අන්න එහෙම කලොත් ඔබ දුක කෙලවර කරනවා" කියල

බුදුරජාණන් වහන්සේ මට දේශනා කරල පිණ්ඩපාතේ වැඩිය. මගේ ජීවිත කාලයටම මං අහපු බණ පදය එච්චරයි. ඒක අහල මම භාවනා කරන්න ගත්ත.

බුදුරජාණන් වහන්සේගේ ඒ ශ්‍රී සද්ධර්මය මට හම්බ වුනා. ඊට පස්සෙ වෙච්ච සිද්ධිය ඔය ඇත්තො දන්නවනෙ.

මෙසේ කිවූ බාහිය දාරුචීරිය තවුසා, ප්‍රීතිමත් මුහුණෙන් යුක්තව අවසන් සුසුම හෙලනව.

ජිනං වන්දාම ගෝතමං

පුජනීය පදියතලාවේ මේධාවි හිමි